DOI: 10.31357/fhssmph.2013.00083

# ශ්‍රී ලංකාවේ සංගීත අධ්‍යාපනයේ විකාශය

# හා එහි නූතන ප්‍රවණතා

එම්. අයි. එස්. ද සිල්වා වීරක්කොඩි

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ

දර්ශනපති පරීක්ෂණය සඳහා සංස්කෘතික අධ්‍යයනය

විෂය යටතේ ඉදිරිපත් කරන නිබන්ධය යි.




දර්ශනපති 2011

## අපේක්ෂකයා ගේ ප්‍රකාශය

මේ ශාස්ත්‍රීය නිබන්ධය ජ්‍යෙෂ්ඨ මහාචාර්ය වෝල්ටර් මාරසිංහ, මහාචාර්ය රෝලන්ඩ් අබේපාල, ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර ගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරන ලද බවත්, මේ පර්යේෂණය කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්වවිද්‍යාලයකට හෝ ආයතනයකට හෝ වෙනත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් සඳහා ද ඉදිරිපත් නොකරන ලද බවත් සහතික කරමි.

mqweerakkody

එම්. අයි. එස්. ද සිල්වා වීරක්කොඩි

**උපදේශක සහතිකය**

මේ අපේක්ෂකයා විසින් කරන ලද ප්‍රකාශය සත්‍ය බවත්, මේ නිබන්ධය ඇගයීම් කාර්යය සඳහා විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කිරීමට සුදුසු බවත් නිර්දේශ කරමි/ කරමු.

| **උපදේශක** | **අත්සන** | **දිනය** |
|---|---|---|
| 1. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය වෝල්ටර් මාරසිංහ<br>භාෂා හා සංස්කෘතික අධ්‍යයනාංශය,<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය. | ............................ | 2011.12.31 |
| 2. මහාචාර්ය රෝලන්ඩ් අබේපාල<br>අධ්‍යාපන මනෝවිද්‍යා අධ්‍යයනාංශය,<br>අධ්‍යාපන පීඨය,<br>කොළඹ විශ්වවිද්‍යාලය. | ............................ | 2011.12-31 |
| 3. ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර<br>සමාජවිද්‍යා හා මානවවිද්‍යා අධ්‍යයනාංශය,<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය. | ............................ | 2011-12-31 |

**අධ්‍යයනාංශ ප්‍රධාන නිර්දේශය**

භාෂා හා සංස්කෘතික අධ්‍යයනාංශ ප්‍රධාන අත්සන

දිනය

## අනුක්‍රමිකාව


- අපේක්ෂකයා ගේ ප්‍රකාශය
- උපදේශක සහතිකය
- අනුක්‍රමිකාව
- උපකාරානුස්මෘති
- නිබන්ධ සාරංශය
- වගු නාමාවලිය
- ප්‍රස්තාර නාමාවලිය

1 පරිච්ඡේදය

1.1 හැඳින්වීම

1.2 පර්යේෂණ ගැටලුව

1.3 පර්යේෂණ අරමුණු

1.4 උපකල්පනය

1.5 පර්යේෂණ ක්‍රමවේදය

1.6 පර්යේෂණ ක්ෂේත්‍රය/ සීමා

1.7 පර්යේෂණ වැදගත්කම

**2 පරිච්ඡේදය**

**2.1 සෞන්දර්ය අධ්‍යාපනය තුළ සංගීත අධ්‍යාපනය**

2.1.1 සංගීතය, සංගීත අධ්‍යාපනය හඳුනාගැනීම

2.1.2 සංගීතවේදය හෙවත් සංගීතවිද්‍යාව

2.1.3 සංගීත අධ්‍යාපන වැදගත්කම හා ප්‍රතිලාභ

**2.2 සංගීත අධ්‍යාපන අරමුණු (විෂය පථය)**

2.2.1 ප්‍රජානන ක්ෂේත්‍රයේ අරමුණු

2.2.2 ආවේදන ක්ෂේත්‍රයේ අරමුණු

2.2.3 මනෝචාලක ක්ෂේත්‍රයේ අරමුණු

**2.3 සංගීත අධ්‍යාපන සංකල්ප**

2.3.1 කොඩලි මතය

2.3.2 සුසුකි මතය

**2.4 සංගීත විෂය ඉගැන්වීමේ ස්වභාවය**

2.4.1 ඉගැනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

2.4.2 ඉගැනුම් න්‍යාය

2.4.3 විෂය මාලාව

2.4.4 ඇගයීම් ක්‍රමය

3 පරිච්ඡේදය

ශ්‍රී ලංකාවේ සංගීත අධ්‍යාපන විකාශය

3.1 ඓතිහාසික පසුබිම

3.1.1 පුරාතන යුගය

3.1.2 මධ්‍යයතන යුගය

3.2 පෘතුගීසි අධ්‍යාපන ක්‍රමය තුළ සංගීත අධ්‍යාපනය

3.3 ලන්දේසී අධ්‍යාපන ක්‍රමය තුළ සංගීත අධ්‍යාපනය

3.4 බ්‍රිතාන්‍ය යුගයේ සංගීත අධ්‍යාපනය

3.5 නිදහසින් පසු ලංකාවේ සංගීත අධ්‍යාපනය

3.5.1 පාසල් රජයට පවරාගැනීම දක්වා යුගය

3.5.2 ශ්‍රී ලංකාවේ ජනරජයක් වීම දක්වා යුගය

3.5.3 පළාත් සභා බිහිවීම දක්වා යුගය

4 පරිච්ඡේදය

ශ්‍රී ලංකාවේ සංගීත අධ්‍යාපනයේ ස්වභාවය හා ප්‍රවණතා පිළිබඳ ක්ෂේත්‍ර අධ්‍යයනය, දත්ත විශ්ලේෂණය හා පර්යේෂණ වාර්තාව

4.1 ක්‍රමවේදය හා පර්යේෂණ උපකරණ

4.1.1. පළමුවැනි අරමුණ

4.1.1.1. පර්යේෂණ ක්‍රමය

4.1.1.2 නියැදිය තෝරාගැනීම

4.1.1.3 දත්ත රැස්කරන උපකරණ

4.1.2 දෙවැනි අරමුණ

4.1.2.1. පර්යේෂණ ක්‍රමය

4.1.2.2 නියැදිය තෝරාගැනීම

4.1.2.3 දත්ත රැස්කරන උපකරණ

4.1.3 තෙවැනි අරමුණ

4.1.3.1. පර්යේෂණ ක්‍රමය

4.1.3.2 නියැදිය තෝරාගැනීම

4.1.3.3 දත්ත රැස්කරන උපකරණ

**4.2 දත්ත ඉදිරිපත් කිරීම හා දත්ත විශ්ලේෂණය**

4.2.1 සංගීත අධ්‍යාපනයේ නූතන ප්‍රවණතා

4.2.2 සංගීත අධ්‍යාපනයේ ගැටලු

**5 පරිච්ඡේදය**

**සමාලෝචනය**

**5.1 නිගමන**

**5.2 යෝජනා**

- **මූලාශ්‍රය හා ආශ්‍රිත ග්‍රන්ථ හා ලේඛන නාමාවලිය**
- **උපග්‍රන්ථය 1**
- **උපග්‍රන්ථය 2**

## උපකාරානුස්මෘති


මෙම නිබන්ධය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මගින් පිරිනමනු ලබන දර්ශනපති උපාධියේ එක් අවශ්‍යතාවක් ඉටුකිරීම උදෙසා සම්පාදනය කරන ලද්දකි. මෙම පර්යේෂණය සඳහා මා විසින් පාදක කරගන්නා ලද්දේ ''ශ්‍රී ලංකාවේ සංගීත අධ්‍යාපනයේ විකාශය හා එහි නූතන ප්‍රවණතා'' යන මාතෘකාව යි. මෙම මාතෘකාව අනුමත කර දුන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපතිනි මහාචාර්ය ස්වර්ණා පියසිරි ඇතුළු කාර්ය මණ්ඩලයටත්, භාෂා හා සංස්කෘතික අධ්‍යයනාංශයේ හිටපු අධ්‍යයනාංශ ප්‍රධාන ආචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ මහතා හා වත්මන් අධ්‍යයනාංශ ප්‍රධාන, ශාස්ත්‍රපති ප්‍රදීප් රත්නායක මහතා ඇතුළු කාර්යමණ්ඩලය ප්‍රථමයෙන් සිහිපත් කරනු කැමැත්තෙමි.

මෙම නිබන්ධය ක්‍රමානුකූල ව නිම කිරීම උදෙසා මා හට අවශ්‍ය මාර්ගෝපදේශකත්වය සැපයූ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සංස්කෘත පිළිබඳ මහාචාර්ය ව සිටි වෝල්ටර් මාරසිංහ, කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ මහාචාර්ය රෝලන්ඩ් අබේපාල හා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සමාජ හා මානව විද්‍යා අධ්‍යයනාංශයේ ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර යන ගුරු භවතුන් භක්ත්‍යාදරයෙන් සිහිපත් කරමි.

මෙම පර්යේෂණය සිදු කිරීම සඳහා අවශ්‍ය කරන ආයතනික හා මානසික සහනය සලසා-දුන්, මා සේවය කරන සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ සංගීත පීඨයේ, පීඨාධිපති ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය බී. ආර්. දසනායක, සංගීත විද්‍යා අධ්‍යයනාංශ ප්‍රධාන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අනුර රත්නසේකර, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය විල්ටස් දයාවංශ හා මහාචාර්ය කෝලිත භානු දිසානායක යන ගුරුපියවරුන් හට ද, ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී හේරත් වන්නිනායක මහතා ට ද ස්තුතිය පිරිනමමි. එමෙන් ම අවශ්‍ය තැන්හි දී සම්බන්ධීකරණ කටයුතු සහ පරිවර්තන කටයුතු කිරීමෙන් සහාය වූ කථිකාචාර්ය ධම්මික දිසානායක මහතා ද ගෞරවයෙන් සිහිපත් කරමි.

එමෙන් ම අවශ්‍ය කරන දත්ත හා සංඛ්‍යා ලේඛන මෙන් ම සම්මුඛ සාකච්ඡා ලබාදීමෙන් මා හට සහය දැක්වූ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් අනුර එදිරිසිංහ, විභාග කොමසාරිස් (පර්යේෂණ හා සංවර්ධන) ගයාත්‍රි අබේගුණසේකර, විභාග කොමසාරිස් (පාලන) සනත් පූජිත, සහකාර විභාග කොමසාරිස්වරුන් වන මාධව වරකාගොඩ හා ලසික සමරකෝන් යන මහත්ම මහත්මීන් ගේ කාරුණික අනුග්‍රහය ද අගය කරමි. තව ද සම්මුඛ සාකච්ඡා ලබා දෙමින් හා පෞද්ගලික පුස්තකාලය සතු ලේඛන ලබා දෙමින් ගිරාගම ගුරු විද්‍යාලේ හිටපු විදුහල්පති ජයන්ත අරවින්ද මහතා කළ දිරිමත් කිරීම අප්‍රමාණ ය. ලංකාවේ සංගීත දෙපාර්තමේන්තුවෙහි පළමු සංගීත ගුරුවරයා වූ නිමල් වෙල්ගම, ජාතික අධ්‍යාපන ආයතනයේ ව්‍යාපෘති නිලධාරිනි ජානකී පතිරණ යන මහත්ම-මහත්මීන් හට ද හදපිරි ප්‍රණාමය පුදකරමි.

අවිවේකී වටපිටාවක් තුළ සිටිමින් කළ මෙම පර්යේෂණ කාර්යය කරගෙන යාම සඳහා අවශ්‍ය විවේකය හා මානසික පරිසරයක් ගොඩනගා දෙමින් නිබඳ ව මා ගේ ජීවිතයට අස්වැසිල්ලක් වූ දයාබර සංඛ තිලකරත්න, අම්මා, පුංචි අම්මා මෙන් ම දසිත් හා රනුල් තිලකරත්න යන පුතුන් දෙපළ ද ආදරයෙන් සිහිපත් කරමි. තව ද සෙවනැල්ලක් මෙන් ළඟ හිඳිමින් මා දිරිමත් කළ ආදරණීය තාත්තා, තරංගා, නිලංගා, අසංගා, ලවංගා වීරක්කොඩි යන මාගේ සහෝදරියන් සැමදා සිහිපත් කරමි. පිටුවෙන් පිටුව නිබන්ධය ලියා අවසන්කර ආස්වාදය ලබන්නට මෙන් ම, සැම තැන්හි ම අවශ්‍ය කටයුතු සම්පාදනය කරමින් රුවන් ප්‍රේමවීර සොහොවුරු ලබා-දුන් අප්‍රතිහත ධෛර්යය හා සහයෝගය ප්‍රමාණවත් කළ නොහැකි ය.

මෙම නිබන්ධය පරිගණක අක්ෂර සංයෝගය කරදුන් චමරි අමරසේන මහත්මිය හා ලවංගා රසන්දනී වීරක්කොඩි නැගණියනට ස්තුතිවන්ත වෙමි. අවසන් වශයෙන් මෙම කාර්යය සාර්ථක කර-ගැනීම උදෙසා නන් අයුරින් සහය ලබාදුන් සැමට මාගේ හදපිරි ස්තුතිය පිරිනැමීමට කැමැත්තෙමි.

# ශ්‍රී ලංකාවේ සංගීත අධ්‍යාපනයේ විකාශය

# හා එහි නූතන ප්‍රවණතා

එම්. අයි. එස්. ද සිල්වා වීරක්කොඩි

## නිබන්ධ සාරාංශය

මෙම අධ්‍යයනය මගින් උත්සාහ කරනු ලැබ ඇත්තේ ශ්‍රී ලංකාවේ සංගීත අධ්‍යාපන විකාශය හා එහි නූතන ප්‍රවණතා පිළිබඳ විමසා බැලීමට ය. ඒ අනුව ලංකාවේ සංගීත අධ්‍යාපනය කිනම් වකවානුවක ඇරඹිණි ද, එහි ගමන්මග කෙබ ඳු ද, එහි වර්තමාන ස්වභාවය හා එයට ඇති අභියෝග කවරේ ද, එම අභියෝග ජය ගැනීම උදෙසා ගත හැකි ක්‍රියාමාර්ග කවරේ ද යන්න විමසා බැලීමට මෙමගින් යත්න දරා ඇත.

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ සෞන්දර්ය විෂයක් ලෙස පෙරදිග සංගීතය ආරම්භ වී ඇත්තේ 1928 තරම් ඈත කාලයක දී වන අතර, වර්තමානයේ එම විෂය පශ්චාද්-උපාධි මට්ටම දක්වා වර්ධනය වී ඇත. එහෙත් මෙම සංගීත අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධ ව සිදු කරනු ලැබ ඇති ශාස්ත්‍රීය පර්යේෂණ ඉතාමත් විරල බව මෙහි දී අවබෝධ වූ කරුණකි. එම නිසා දේශීය මෙන් ම විදේශීය වශයෙන් විවිධ විද්වතුන් විසින් පළ කරන ලද ශාස්ත්‍රීය ග්‍රන්ථ හා ඔවුන ගේ අදහස් මෙන් ම සංගීත ක්ෂේත්‍රයට අදාළ චක්‍රලේඛ, වාර්ෂික වාර්තා, සංඛ්‍යා ලේඛන, අත්පොත්, අධ්‍යාපන මොඩියුල යනාදිය ඇසුරෙන් මෙම පර්යේෂණය සඳහා අවශ්‍ය තොරතුරු සම්පාදනය කරගන්නා ලදී. ඒ අනුව සමස්ත සංගීත ගුරු ප්‍රජාව ආවරණය වන පරිදි දිස්ත්‍රික් කිහිපයකින් තෝරාගත් අහඹු ගුරු නියැදියක් වෙත සංවෘත ප්‍රශ්නාවලියක් යොමු කිරීමෙන් ගුරු ආකල්පය විමර්ශනය කළෙමි. එමෙන් ම අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය සඳහා පෙනී සිටි සමස්ත පෙරදිග සංගීත ශිෂ්‍ය ප්‍රජාව නියෝජනය වන පරිදි 10% ක ශිෂ්‍ය නියැදියක් විශ්ලේෂණය කිරීමෙන් නිගමන කරා එළඹීමට උත්සහ දරන ලදී.

සංගීත විෂයේ විකාශය පිළිබඳ විමසීමේ දී එය දශක අටකට වැඩි දීර්ඝ ඉතිහාසයක් දක්වා ගමන් කරන බවත්, විවිධ වකවානුවල දී නොයෙක් වෙනස්කම්වලට භාජනය වෙමින් වර්තමානය දක්වා ම අඛණ්ඩ ව පැවති විෂයක් බවත් අනාවරණය විය. පසුගිය දශකය දෙස විශේෂ අවධානය යොමු කිරීමේ දී පෙරදිග සංගීත විෂය ක්ෂේත්‍රය ආශ්‍රිත ව මූලික ව හඳුනාගත හැකි ප්‍රවණතා රාශියක් වේ.

කෙසේ වුව ද, දත්ත විශ්ලේෂණය කිරීමේ දී අනාවරණය වූ ප්‍රධානතම කරුණක් වන්නේ මෙකී විෂයට තිබූ සාපේක්ෂ වැදගත්කම ක්‍රමයෙන් හීන වී ඇති බව ය. නැතහොත් සංගීත විෂය මෙරට අධ්‍යාපන විෂය ක්ෂේත්‍රය තුළින් ගිලිහෙමින් පවතින බව කැපී-පෙනුණි. තව ද මෙකී විෂය ක්ෂේත්‍රය ආශ්‍රිත ව හඳුනාගත හැකි ගැටලු කිහිපයකි. එනම්, පාසල් විෂය මාලාව තුළ නිසි තැන හිමි නොවීම, ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණය සඳහා නොපැමිණි ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ අගයක් ගැනීම, ගුරුවරුන් ගේ උදාසීන බව, පරිපාලන දායකත්වය අවම වීම, මූලික පහසුකම් තවමත් ප්‍රමාණවත් නොවීම යනාදිය ඒ අතර වේ.

පෙරදිග සංගීත විෂය තව දුරටත් මෙරට අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ රඳවා තබාගත යුතු විෂයක් වන බැවින් එය සුරක්ෂිත කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමේ අවශ්‍යතා ව ඉස්මතු ව ඇති බව පෙනේ. ඒ අනුව විෂයේ ප්‍රගමනය උදෙසා අනුගමනය කළ හැකි වෙති යි අපේක්ෂිත ක්‍රියාමාර්ග කිහිපයකි. ඒ අතර සංගීත ගුරුවරයා ගේ නිසි ගෞරවය හා වෘත්තීයමය තත්ත්වය නගා සිටුවීම, ගුරු පුහුණුව යාවත්කාලීන කිරීම, සංගීත අධ්‍යාපන කළමනාකරණය විධිමත් කිරීම, සංගීත අධ්‍යාපනයට අදාළ මූලික පහසුකම් ප්‍රවර්ධනය කිරීම, නිපුණතා පාදක අධ්‍යාපනය තුළ ශිෂ්‍ය කාර්යය ප්‍රබල කිරීම යනාදිය වේ. මෙකී යෝජනා ක්‍රියාවට නැංවීමට හැකියාවක් තිබේ නම් දශක අටකට වැඩි ඉතිහාසයක් ඇති පෙරදිග සංගීත විෂය වර්තමානයේ පවතින තත්ත්වයට වඩා යම් ප්‍රමාණයකින් හෝ නගා-සිටුවීමට හැකි වෙති යි අපගේ විශ්වාසය යි. ඒ සඳහා වගකිවයුත්තන් ගේ මෙන් ම ගුරු සිසු පරපුරේ ද අවධානය යොමු විය යුතු කාලය එළඹ ඇති බව අවධාරණය කළ යුතු වේ.

**වගු නාමාවලිය** **පිටු අංකය**


වගු අංක 3.2.1
පෘතුගීසි සමයේ පැවති පාසල් පද්ධතිය හා විෂය මාලාව 139

වගු අංක 3.5.1.1
1956 අංක 43 චක්‍ර ලේඛයට අනුව ප්‍රාථමික පාසල් විෂය ගණ 161

වගු අංක 3.5.2.1
1962 අංක 9 චක්‍ර ලේඛය අනුව 9 හා 10 පන්ති සඳහා වූ විෂය මාලාව 164

වගු අංක 3.5.3.1
1981 පාසල් විෂය මාලාව 172

වගු අංක 4.1.1.2.1
පුද්ගල නියැදිය තුළ අධ්‍යාපන මට්ටම නියෝජනය වන ආකාරය 176

වගු අංක 4.1.2.2.1
ශිෂ්‍ය නියැදිය තුළ දිස්ත්‍රික් නියෝජනය වන ආකාරය 179

වගු අංක 4.2.1.1
2010 අ.පො.ස (සා.පෙළ) සෞන්දර්ය විෂයයන් සඳහා පෙනී සිටි පාසල් අපේක්ෂකයින් ගණන හා එහි ප්‍රතිශතයන් 184

වගු අංක 4.2.1.2
අ.පො.ස. (සා.පෙළ) ප්‍රායෝගික හා ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු ලබාගැනීම 187

වගු අංක 4.2.1.3
අ.පො.ස. (සා.පෙළ) පෙරදිග සංගීත විෂය සඳහා පෙනී සිටි පාසල් අපේක්ෂකයින් සංඛ්‍යාව 2001 - 2010 188

වගු අංක 4.2.1.4
අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී තෝරාගත් සෞන්දර්ය විෂයන් කිහිපයක් සඳහා ඉදිරිපත් වූ පාසල් අපේක්ෂකයින් සංඛ්‍යාව 2005 - 2010 190

වගු අංක 4.2.1.5
තෝරා ගත් සෞන්දර්ය විෂයන් කිහිපයක සමත් , අසමත් ප්‍රතිශතය 191

වගු අංක 4.2.1.6
අ.පො.ස. සා.පෙළ පාසල් අයදුම්කරුවන් A සාමර්ථ හිමිකරගැනීමේ
ප්‍රතිශතය 193

වගු අංක 4.2.1.7
චිත්‍ර විෂය සාධනය 2005 - 2010 195

වගු අංක 4.2.1.8
අ.පො.ස. උසස් පෙළ පෙරදිග සංගීත විෂයය සඳහා පෙනී සිටි 196
අපේක්ෂකයින් සංඛ්‍යාව 2002 - 2010

වගු අංක 4.2.1.9
අ.පො.ස (සා.පෙළ) විභාගයේ දී සෞන්දර්ය විෂයයන් අසමත් වීමේ
ස්වභාවය (%) 2006 - 2010 197

වගු අංක 4.2.1.10
අ.පො.ස. උසස් පෙළ පෙරදිග සංගීතය අසමත් ස්වභාවය 198

වගු අංක 4.2.1.11
පෙරදිග සංගීත විෂය ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු ලබා
ඇති ආකාරය (නියැදිය) 201

වගු අංක 4.2.1.12
පෙරදිග සංගීත විෂය ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලකුණු ලබා
ඇති ආකාරය (නියැදිය) 202

වගු අංක 4.2.1.13
පෙරදිග සංගීත විෂය පරීක්ෂණය සඳහා ලකුණු ලබා 203
ඇති ආකාරය (නියැදිය)

වගු අංක 4.2.1.14
පාසල් අයදුම්කරුවන් පෙරදිග සංගීත විෂයය සඳහා A හා B
සාමර්ථ ලබාගැනීමේ ස්වභාවය 2001 - 2010 206

වගු අංක 4.2.1.15
පෙරදිග සංගීත විෂය සඳහා C හා S සාමර්ථ ලබාගැනීමේ
ස්වභාවය 2001 - 2010 207

වගු අංක 4.2.1.16
තෝරා ගත් වසර කිහිපයක පෙරදිග සංගීත විෂය සාමාන්‍ය පෙළ 208
හා උසස් පෙළ සමත් ප්‍රතිඵල ප්‍රතිශතය

වගු අංක 4.2.1.17
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ සංගීත පීඨයේ ලියාපදිංචි
ශිෂ්‍ය සංඛ්‍යාව 2003 -2009 210

වගු අංක 4.2..1.18
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ නර්තන පීඨයේ ලියාපදිංචි
ශිෂ්‍ය සංඛ්‍යාව 2003 - 2009 210

වගු අංක 4.2.19
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ කලා පීඨයේ ලියාපදිංචි
ශිෂ්‍ය සංඛ්‍යාව 2003 - 2009 211

වගු අංක 4.2.20
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ සංගීත පීඨයේ ලියාපදිංචි
ශිෂ්‍ය සංඛ්‍යාව 1998 - 2005 212

වගු අංක 4.2.21
විශ්වවිද්‍යාලවල සංගීත විෂය සඳහා ලියාපදිංචිය 225

වගු අංක 4.2.2.1
භාවිත ඉගැන්වීම් ක්‍රමවේද (නියැදිය) 226

වගු අංක 4.2.2.2
අ.පො.ස. (සා.පෙළ) විභාගය සඳහා ඉදිරිපත් වූ පාසල් 230
අයදුම්කරුවන් සංඛ්‍යාව 2001 - 2009

වගු අංක 4.2.2.3
සිසුන් ලබාගත් ශ්‍රේණි සහ නොපැමිණි සංඛ්‍යාව 2010 - (නියැදිය) 238

වගු අංක 4.2.2.4
අ.පො.ස. සාමාන්‍ය පෙළ 2010 පෙරදිග සංගීත අපේක්ෂකයින් සංඛ්‍යාව 239

වගු අංක 5.2.1
තෝරාගත් අධ්‍යාපන කලාප කීපයක පළමුවතාවට පෙනී සිටි පාසල් 252
අයදුම්කරුවන් ප්‍රතිඵල ලබාගෙන ඇති ආකාරය - 2009

**ප්‍රස්තාර නාමාවලිය** **පිටු අංකය**

ප්‍රස්තාර අංක 4.1.1.2.1
පුද්ගල නියැදිය තුළ වයස් මට්ටම නියෝජනය වන ආකාරය 176

ප්‍රස්තාර අංක 4.1.1.2.2
පුද්ගල නියැදිය තුළ වෘත්තීමය පළපුරුද්ද නියෝජනය වන
ආකාරය 177

ප්‍රස්තාර අංක 4.2.1.1
අ.පො.ස. (සා.පෙළ) පෙරදිග සංගීත විෂය සඳහා පෙනී සිටි පාසල්
අපේක්ෂකයින් සංඛ්‍යාව 2001 - 2010 189